මගේ අංකය -DL/E/06/05(VI) 2021

ආයතන අංශය

කම්කරු දෙපාර්තමේන්තුව

නාරාහේන්පිට

කොළඹ 05

2020.09. 08

**සියළුම කම්කරු කොමසාරිස්වරුන් /ප්‍රධාන ගණකාධිකාරී/ප්‍රධාන අභ්‍යන්තර විගණක**

**නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරුන් /නියෝජ්‍ය සංඛ්‍යාලේඛනඥ**

**සහකාර කම්කරු කොමසාරිස්වරුන් /දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරුන්/විගණන අධිකාරී**

**ජ්‍යෙෂ්ඨ කම්කරු නිලධාරින්**

**ඒකාබද්ධ සේවාවන්හි නිලධරයන්ගේ වාර්ෂික ස්ථාන මාරු -2021**

ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක COMS/Trans/V/ වා.ස්.මා.2021 හා 2020.08.31 දිනැති ඒකාබද්ධ සේවා චක්‍රලේඛ අංක 01/2020 මගින් පහත ඒකාබද්ධ සේවාවන්හි නිලධරයන්ගේ වාර්ෂික ස්ථාන මාරු සඳහා අයදුම්පත් කැඳවා ඇත. මෙම ස්ථාන මාරු 2021 මාර්තු මස 01 දින සිට බලපැවැත්වේ.

i. රජයේ භාෂා පරිවර්තක සේවය (I පන්තිය)
ii. ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය (2/3 පන්ති)
iii. සංවර්ධන නිලධාරී සේවය (III,II,I ශ්‍රේණි)
iv. ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවය (III,II,I පන්ති)
v. කළමනාකරණ සේවා නිලධාරී සේවය (III,II,I ශ්‍රේණි)
vi. ඒකාබද්ධ රියදුරු සේවය (III,II,I විශේෂ ශ්‍රේණි)
vii. කාර්යාල සේවක සේවය (III,II,I විශේෂ ශ්‍රේණි)

ඒ අනුව ඔබ කාර්යාලයේ සේවයේ නියුතු ඉහත සේවාවන්ට අදාළ වාර්ෂික ස්ථානමාරු වීම් අයදුම් කිරීමට බලාපොරොත්තු වන සියලුම නිලධාරින් http://43.224.125.68/misco ඔස්සේ මාර්ගගත ක්‍රමයෙන් ස්ථාන මාරු ඉල්ලුම් කල යුතුය. මාර්ගගත ක්‍රමය ඔස්සේ සම්පූර්ණ කරන ලද අයදුම්පතේ මුද්‍රිත පිටපත් 2ක් අයදුම්කරුගේ අත්සන සහිතව 2020.09.20 දිනට පෙර ප්‍රධාන කාර්යාලය වෙත ලැබීමට සැලැස්විය යුතුය. ඒකාබද්ධ රියදුරු සේවයේ හා කාර්යාල සේවක සේවයේ නිලධාරින්ට මාර්ගගත ක්‍රමය ඔස්සේ පෞද්ගලිකව අයදුම් කිරීම අපහසු වේ නම් ඒ සඳහා කාර්යාලය මගින් ඔවුන්ට අවශ්‍ය පහසුකම් සලසා දිය යුතුය.

- 2020 සැප්තැම්බර් 02 දින සිට 2020 දෙසැම්බර් 31 දින දක්වා අතර කාලයේදී අන්‍යොන්‍ය ස්ථාන මාරුවීම් සඳහා ඉල්ලුම්පත් නොඑවිය යුතුය.

- ඔබ කාර්යාලයන්හි රඳවා ගැනීමට අවශ්‍ය නිලධාරින් සහ වෛද්‍ය සහතික මගින් සනාථ කර ඇති බරපතල රෝගාබාධ වලින් පෙළෙන ස්ථාන මාරු නොකළ යුතු නිලධාරින් පිළිබඳව අංශ/කාර්යාල ප්‍රධානියා විසින් පුද්ගලිකව සනාථ කළ යුතුය.

- ස්ථාන මාරුවීම් ලැබීමට ඉඩ ඇතැයි සිතන විශේෂ පුහුණු ලබා ඇති කිසියම් නිලධාරියකු සේවා අවශ්‍යතාව මත තවත් වර්ෂයක් රඳවා ගත යුතු යයි අදහස් කරන්නේ නම් ඒ සඳහා සාධාරණීකරන වාර්තාවක් සමග ඔබගේ නිර්දේශ ඉදිරිපත් කළ යුතුය.

- එක් නිලධරයෙකු මාර්ගගත ක්‍රමය ඔස්සේ එක් අයදුම්පතක් පමණක් ඉදිරිපත් කරන ලෙසට උපදෙස් ලබාදිය යුතුය. ස්ථාන මාරුවීම් අයදුම් කරන නිලධාරීන් කිසියම් ප්‍රදේශයක නිශ්චිත කාර්යාලයකට පමණක්ම ස්ථාන මාරු වී යාමට අපේක්ෂා කරන්නේ නම් කිසියම් ප්‍රදේශයකට යාමේ අවශ්‍යතාවය මතද නැතහොත් තමන් කැමති දෙපාර්තමේන්තු හෝ කාර්යාලයකට යාමට උවමනාවෙන්ද යන්න අයදුම්පතේ සඳහන් කිරීම සුදුසුය.ඒ අනුව තමන්ගේ මනාපය අනුපිළිවෙලින් දැක්වෙන පරිදි ප්‍රදේශ හෝ කාර්යාල නම් කල යුතුය.

- ඒකාබද්ධ සේවයේ නිලධාරිනියන් වර්තමාන සේවා ස්ථානය තුල ප්‍රසූත නිවාඩු ලබා තිබේ නම්,ඒ බව වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත්‍රයේ අනිවාර්යෙන්ම සඳහන් කල යුතුය.

- ස්ථාන මාරුවීම් ලැබේ යැයි අපේක්ෂා කරන නිලධරයන්ගේ රාජකාරි කටයුතු කල් ඇතිව වෙනත් නිලධරයන්ට පුහුණු කළ යුතුය.

- මෙම ස්ථාන මාරු චක්‍රලේඛය WWW.Pubad.gov.lk යන වෙබ් ලිපිනය ඔස්සේ ලබාගත හැකි අතර ඒ අනුව ඔබ කාර්යාලයේ සේවයේ නියුතු සියලුම නිලධාරින් දැනුවත් කිරීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

අ/කලේ -ඒ.විමලවීර

කම්කරු කොමසාරිස් ජනරාල්

එච්.ටී.පී අබයරත්න

නියෝජ්‍ය කම්කරු කොමසාරිස් (පාලන)

එච්.ටී.පී.අබයරත්න
වැ.බ. නියෝජ්‍ය කම්කරු කොමසාරිස් (පාලන)
කම්කරු දෙපාර්තමේන්තුව
කොළඹ 05.